සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, නවදුන කෝරළේ, මැද පත්තුවේ, රත්නපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, රත්නපුර නගරසභා සීමාව තුළ, මුවගම - 182, ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, ශ්‍රී බේමානන්ද මාවත (වරිපනම් අංක 30 දරන පරිශ්‍රයේ) පිහිටි "අවරදෙණිය මෙගොඩහේන"නැමැති ඉඩම මැන බලයලත් මිනින්දෝරු එම්. වර්ණසූරිය විසින් සම්පාදිත 2002.06.16 දිනැති අංක 516 දරන පිඹුරේ දැක්වෙන ලොට් 1 කොටසට උතුරින් : වරිපනම් අංක S 26 සහ 38 දරන එකී ඉඩමේ කොටස ද, නැගෙනහිරින් : ප්‍රවේශය සහ වරිපනම් අංක S 26 දරන ඉඩමේ මෙම කොටස ද, දකුණින් : ප්‍රවේශය සහ ශ්‍රී බේමානන්ද මාවත ද, බස්නාහිරින් : ශ්‍රී බේමානන්ද මාවත සහ වරිපනම් අංක 36 දරන ඉඩමේ මෙම කොටස ද මායිම් වූ ප්‍රමාණයෙන් පර්චස් දහයයි දශම නවය (අ. 0, රූ. 0, පර්. 10.9) හෝ හෙක්ටයාර් 0.02756 විශාලත්වය ඇති ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි, වැවිලි සහ සියලු දෙය වේ. මෙම ඉඩම රත්නපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රිරු K 78/107 හි ලියාපදිංචිව ඇත.

තව ද ඉහත කී ඉඩම පහත සඳහන් ඉඩමින් බෙදා වෙන් කරන ලද්දකි.

ඉහත සඳහන් රත්නපුර, මුවගම ශ්‍රී බේමානන්ද මාවත පිහිටි "අවරදෙණිය මොගොඩහේන" නැමැති ඉඩමට මායිම්, උතුරින් : අවරදෙණිය මෙගොඩහේන කැබැල්ල ද, නැගෙනහිරින් : අවරදෙණිය මෙගොඩහේන ඉඩම් කොටසක් වන දැනට ඩී. එන් කරුණාතිලකට අයිති ඉඩම ද, දකුණින් : වී. සී. පාර ද, බස්නාහිරින් : අවරදෙණිය මොගොඩහේන කොටසක් ද මායිම් වූ ප්‍රමාණයෙන් රූඩ් එකක් (අ.0, රූ.1, පර්.0) ඉඩම වේ. තව ද, මෙම ඉඩම රත්නපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව B 336/171හි ලියාපදිංචිව ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

රජිත කරුණාතිලක,
සහකාර කළමනාකරු - ණය අයකර ගැනීම්.

03 - 147/2

---

## පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී - කුලියාපිටිය ශාඛාව

### 1990 අංක 4 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීමයි.

ගණුදෙනුකරුවන්ගේ නම් : මහරගේ ට්‍රිනී රොහාන් චන්දන පෙරේරා සහ ඇටම්පොළ ආරච්චිගේ දොන බෙලින්ඩස් ඉරෝෂා දමයන්ති.

දේපළෙහි ලිපිනය : ඇටඹගහමුළහේන, ගයියල, කුලියාපිටිය.

පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂක මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනාව වර්ෂ 2019.02.27 වැනි දින ඒකමතිකව සම්මත කර ගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

එනම්, මහරගේ ට්‍රිනී රොහාන් චන්දන පෙරේරා යන අය බන්ධනදායී වශයෙන් ද, සහ ඇටම්පොළ ආරච්චිගේ දොන බෙලින්ඩස් ඉරෝෂා දමයන්ති දුග්ගන්නා රාළලාගේ නිරෝෂා වාසල කුමාරි මඩවල යන අය බන්ධනදායී/උකස්කරු වශයෙන් ද ලියාපදිංචි අංක පී.කිව්. 48 දරන පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී නමට ප්‍රසිද්ධ නොතාරිස් ඩී. වී. ඩී. ආර්. අංගම්මන විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2013.09.04 වැනි දිනැති අංක 5722 සහ වර්ෂ 2015.12.11 දිනැති අංක 6204 දරන උකස් බැඳුම්කරයන් මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

එකී අංක 5722 සහ 6204 දරන උකස් බැඳුම්කරයන් මත ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන දින තෙක් වර්ෂ 2018.10.02 වැනි දින දක්වා මුල් මුදල සහ පොලිය වශයෙන් රුපියල් හය මිලියන හත් ලක්ෂ අට දහස් අටසිය අනූ අටයි ශත පනස් තුනක (රු. 6,708,898.53) මුදල සහ වර්ෂ 2018.10.03 වැනි දින සිට රු. 6,367,907.06ක මුදල මත වාර්ෂිකව 21% බැගින්

පොළිය පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී (මෙහි මින්මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන) වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද,

පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ. ඒ කෙසේද යත්,

ඉහත කී පරිදි අයවිය යුතු රුපියල් හය මිලියන හත් ලක්ෂ අට දහස් අටසිය අනූ අටයි ශත පනස් තුනක (රු. 6,708,898.53) මුදල ඉහතකී දිනයන්හි සිට විකිණීමේ දිනය දක්වා ඉහත සඳහන් පරිදි ලැබිය යුතු පොළිය ද ගාස්තු ද වර්ෂ 1990 අංක 4 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය යටතේ අයකර ගත හැකි මුදල් අයකර ගැනීම සඳහා මහරගේ ප්‍රීනී රොහාන් චන්දන පෙරේරා යන අය බන්ධනදායී වශයෙන් ද, සහ ඇටම්පොළ ආරච්චිගේ දොන බෙලින්ඩස් ඉරෝෂා දමයන්ති දූගන්නා රාළලාගේ නිරෝෂා වාසල කුමාරි මඩවල යන අය බන්ධනදායී/උකස්කරු වශයෙන් ද, ඉහත කී අංක 5722 සහ 6204 දරන උකස් බැඳුම්කරයන් යටතේ මෙහි උපලේඛනයේ වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇත්තා වූ බැංකුව වෙත උකස්කර ඇති දේපළ, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කෝට්ටේ, බැද්දගාන පාර, අංක 134 දරන ස්ථානයෙහි පී. කේ. ඊ. සේනාපති බලපත්‍රලත් වෙන්දේසිකරුවන් වෙත එකී වර්ෂ 1990 අංක 4 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය පරිදි අධිකාරය සහ බලය පවරන ලෙසය.

### උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුලියාපිටිය ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ, කටුගම්පොළ - උතුර කෝරළේ, කටුගම්පොළ හත්පත්තුවේ, කුලියාපිටිය බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ 1177 - කබලාව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, ගයියල ගමේ පිහිටා ඇති, "ඇටඹගහමුලහේන" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමට, බලයලත් මානක එස්. එම්. දිසානායක විසින් සකසන ලද 2013.08.22 දිනැති අංක 4050 දරන පිඹුරෙහි (බලයලත් මානක එස්. එම්. දිසානායක විසින් සකසන ලද 2000.08.17 දිනැති අංක 2792 දරන පිඹුරෙහි ලොට් 02 දරන කොටස නැවත බෙදා වෙන් කරන ලද්දකි.) ලොට් 01 යනුවෙන් නිරූපිත බෙදා වෙන් කරන ලද ඉඩම් කැබැල්ලට මායිම්, උතුරට : ඩබ්ලිව්. ඒ. ඩී. ෆොන්සේකාට අයිති ඉඩම ද, නැගෙනහිරට : ප්‍රාදේශීය සභා පාර ද, දකුණට : බී. එම්. පොඩි මැණිකේට අයිති ඉඩම ද සහ බස්නාහිරට : පිඹුරු අංක 2792 හි ලොට් 1 ද මගින් මායිම් වූ ප්‍රමාණයෙන් පර්චස් තිස් අටක් (අ. 0, රූ. 0, පර්. 38) වූ ඉඩම සහ ඒ මත ඇති ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ ඒ මත පිහිටි අනෙකුත් සියල්ල ද සමග වේ. මෙම ඉඩම කුලියාපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

දේවිකා හල්වතුර,
කළමනාකාරිණී - අයකර ගැනීම්.

03 - 149

---

### ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැනුම්දීම

2018.09.07 වැනි දින පවත්වන ලද රැස්වීමක දී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. ප්‍රසිද්ධ නොතාරිස් එස්. ඒ. ඩී. එස්. කේ. අතුකෝරල විසින් සහතික කරන ලද 2015.05.25 දිනැති අංක 1793 දරන උකස් බැඳුම්කරයට අනුව 2018.07.31 දින තෙක් මුල් මුදල හා පොළිය වශයෙන් රුපියල් දෙකෝටි අනූපන්ලක්ෂ විසිඑක්දහස් නවසිය අසූහතරයි ශත දහයක (රු. 29,521,984.10) මුදල සමග ඉහත ණය මත රුපියල් දෙකෝටි හැත්තෑතුන්ලක්ෂ අනූදෙදහස් පන්සියයක (රු. 27,392,500.00) මුදල මත වසරකට සියයට නවය (9%) බැගින් 2018.08.01 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් තවදුරටත් පොළිය ද ගොඩකවෙල, කෙලින් වීදිය, " නිවිසිරි" අංක 99A හි කොඩිතුවක්කු ආරච්චිලාගේ අරුණ ශාන්ත මහතා වෙතින් අයවිය යුතුව ඇත.

2. ප්‍රසිද්ධ නොතාරිස් එස්. ඒ. ඩී. එස්. කේ. අතුකෝරාල විසින් සහතික කරන ලද 2015.05.25 දිනැති අංක 1793 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු රුපියල් දෙකෝටි අනූපන්ලක්ෂ විසිඑක්දහස් නවසිය අසූහතරයි ශත දහයක (රු. 29,521,984.10) මුදල සමග 2018.08.01 දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොළිය ද, ලංකා බැංකු ආඥා පනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට මහනුවර, ටොරින්ටන් පාරේ, අංක 24හි වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම හට එකී ලංකා බැංකු ආඥා පනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වැනි වගන්තිය යටතේ ද, ලංකා බැංකු ආඥා පනතේ 21 වන වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළ කිරීමට ලංකා බැංකුවේ, ගොඩකවෙල ශාඛාවේ කළමනාකරු හට මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

### ඉහත සඳහන් උපලේඛනය

1. සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, අටකලන් කෝරළේ, මැදපත්තුවේ, ගොඩකවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ ප්‍රාදේශීය සභා සීමාවේ, ගොඩකවෙල ප්‍රාදේශීය සභා සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වරායාය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, පල්ලෙගම පිහිටි "මහහේන සහ නුගගහහේන" නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. එම්. ඩී. එස්. ශාන්ත විසින් සාදන ලද 2003 මාර්තු 09 දිනැති අංක 1965 දරන පිඹුරෙහි නිරූපිත බෙදූ

ඉඩම් කැබැල්ල, උතුරට : T. P. T23454 සහ T23088 ද, නැගෙනහිරට : T.P. T23088, T25907 සහ T22654 ද, දකුණට : T.P. S.P.25908 සහ 9480 ද, බස්නාහිරට : ගොඩකවෙල ග්‍රාමයේ සීමාව සහ T.P.23454 ද මායිම්ව අක්කර දෙකයි පර්චස් විසිදෙකක (අ. 02, රූ. 0, පර්. 22) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති වෙනත් සියලු දේ ද වේ. මෙය ඇඹිලිපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A07/03 හි ලියාපදිංචි කර ඇත.

2. සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, අටකලන් කෝරළේ, මැදපත්තුවේ, ගොඩකවෙල ප්‍රාදේශීය සභා සීමාවේ සහ ගොඩකවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගොඩකවෙල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, ගොඩකවෙල පිහිටි "පල්ලෙදෙනිය සහ පල්ලෙදෙනිය කොරටුව" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු පී. බී. ඉලංගසිංහ විසින් සාදන ලද 2009.01.03 දිනැති අංක R/435 දරන පිඹුරෙහි ලොට් 02 ලෙස දක්වා සීමා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල, උතුරට : ලොට් 01 සහ ප්‍රධාන පාර ද, නැගෙනහිරට : ප්‍රධාන පාර සහ ලොට් 12 (අංක 254 දරන පිඹුරෙහි) ද, දකුණට : අංක 254 දරන පිඹුරෙහි ලොට් 13 සහ පන්සල් වත්ත ද, බස්නාහිරට : පන්සල් වත්ත සහ ලොට් 01 ද මායිම්ව පර්චස් නවයක (අ. 0, රූ. 0, පර්. 9) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති සියලු දේ ද වේ. මෙය ඇඹිලිපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A05/88 හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ටී. ඒ. වී. රංජනී,
සහකාර කළමනාකාරිණී,

ලංකා බැංකුව,
ගොඩකවෙල.

04 - 179

---

**මහජන බැංකුව - කන්තලේ (090) ශාඛාව**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2018.12.18 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ත්‍රිකුණාමලය ප්‍රසිද්ධ නොතාරිස් තිලගරත්නම් තුෂ්‍යන්තන් මහතා විසින් සහතික කරන ලද 2017.12.26 වැනි දිනැති අංක 5559 දරන උකස්කරය සහ ත්‍රිකුණාමලය ප්‍රසිද්ධ නොතාරිස් දිසානායක මුදලිගේ ප්‍රභාත් සමීර දිසානායක මහතා විසින් සහතික කරන ලද 2015.03.30 දිනැති අංක 280 දරන උකස්කරය ප්‍රකාරව අංක 100 යුනිට් 14 වෙන්ඩ්‍රාසන්පුර, කන්තලේ යන ලිපිනයේ පදිංචි රාහුබද්ද කංකානම්ලාගේ සිසිර කුමාර යන අය විසින් ගෙවීම් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ දැනට පිළිවෙලින් රුපියල් හතලිස් පන් ලක්ෂ අසූ තුන්දහස් තුන්සිහ තිස්තුනයි ශත තිස් පහක් (රු. 4,583,333.53) සහ රුපියල් හැත්තෑ අට ලක්ෂයක (රු. 7,800,000.00) මුදලක් මහජන බැංකුවට අයවීමට ඇති බැවින් ද එකී රුපියල් හතලිස් පන් ලක්ෂ අසූ තුන්දහස් තුන්සිය තිස්තුනයි ශත තිස් පහක් (රු. 4,583,333.35) සහ රුපියල් හැත්තෑ අට ලක්ෂයක (රු. 7,800,000.00) මුදලට පිළිවෙලින් 2018.05.29 සහ 2018.07.01 දින සිට වර්ෂයකට පිළිවෙලින් 21% සහ 16.5% බැගින් වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා අදාළ මහජන බැංකු පනතේ 29 එල් (29L) වගන්තිය යටතේ අයකර ගනු ලැබිය යුතු මුදල් හා ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුකර එකී රුපියල් හතලිස් පන් ලක්ෂ අසූ තුන්දහස් තුන්සිය තිස්තුනයි ශත තිස් පහක් (රු. 4,583,333.35) සහ රුපියල් හැත්තෑ අට ලක්ෂයක (රු. 7,800,000.00) මුදල් අයකර ගැනීම සඳහා මහනුවර බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම සමාගම විසින් එකී පිළිවෙලින් අංක 5559 හා අංක 280 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපළ සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවෙහි අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

**උකස් කර ඇති දේපළ පිළිබඳ විස්තරය**

නැගෙනහිර පළාතේ, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, කන්තලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වෙන්ඩ්‍රාසන්පුර ග්‍රාම නිලධාරී වසමේ, කන්තලේ ප්‍රාදේශීය සභා සීමාව තුළ වාට්ටු අංක ආර්/30/2, 92 කණුව හන්දිය කන්තලේ පිහිටි ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. සෙල්ලප්පිල්ලෙයි මහතා විසින් 2003.09.29 වැනි දින මැන සකස් කරන ලද අංක 3504 දරන පිඹුරේ කැබලි අංක 01 දරන ඉඩම් කැබැල්ලට එකී පිඹුරු ප්‍රකාර මායිම්, උතුරට : ඩබ්. එම්. ඩිංගිරි අම්මා යන අය හිමිකම් කියන මෙම ඉඩමේ ඉතිරි කොටස ද, නැගෙනහිරට : නුවර පාර ද, දකුණට : ඇල ද, බස්නාහිරට : ඇල සහ 3504 දරන මෙම පිඹුරේ කැබලි අංක 02 ද යන මෙකී මායිම් තුළ පිහිටි රූඩ් 01 (අ. 0, රූ. 01, පර්. 0.00)ක් විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ, පළතුරු ආදී සෑම සියළු දේද වේ.

ඉහත සඳහන් ඉඩම මෙහි පහත සඳහන් ඉඩමේ වර්තමාන මැනුමක් වේ.

නැගෙනහිර පළාතේ, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, කන්තලේ පත්තුවේ, කන්තලේ ප්‍රාදේශීය සභා බල සීමාව තුළ, කන්තලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වෙන්ඩ්‍රාසන්පුර ග්‍රාම නිලධාරි වසමේ, කන්තලේ ගමේ පිහිටි "කන්තලේ" නමැති ඉඩමට මායිම්, උතුරට : ඩබ්. එම්. ඩිංගිරි අම්මා යන අය හිමිකම් කියන ඉඩම ද, නැගෙනහිරට : නුවර ත්‍රිකුණාමලය පාර ද, දකුණට : ජලාපවහන ඇල ද, බස්නාහිරට : ජලාපවහන ඇල ද යන මායිම් තුළ පිහිටි රූඩ් 01ක් විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ, පළතුරු ආදී සැම සියළු දේද වේ. මෙම දේපළ ත්‍රිකුණාමලය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ LDO/P/12/53 සහ LDO/P/20/182 දරන පත්‍රිරුවල ලියාපදිංචි වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය පරිදි,

ජී. ආර්. එස්. කෝදාගොඩ,
ප්‍රාදේශීය කළමනාකාර.

මහජන බැංකුව.
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
ත්‍රිකුණාමලය.
දුරකථන අංකය : 026-2222815/ 026-2223047
ෆැක්ස් අංකය : 026-2220395

04 - 186

---

## මහජන බැංකුව රැජිණ ශාඛාව, මහජන බැංකුව මූලස්ථාන ශාඛාවට අනුබද්ධ කිරීම

කොළඹ 10, ඩී. ආර්. විජේවර්ධන මාවතේ, අංක 32 දරන ස්ථානයේ පිහිටි මහජන බැංකුව රැජිණ ශාඛාව (033), 2019 අප්‍රේල් මස 08 වැනි දින සිට, කොළඹ 02, සර් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවතේ, අංක 75 දරන ස්ථානයේ පිහිටි මහජන බැංකුව මූලස්ථාන ශාඛාවට (204) අනුබද්ධ කෙරෙන බව ගනුදෙනුකාර භවතුන් හා පොදු මහජනතාව වෙත කාරුණිකව දන්වා සිටිමු.

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී,
ශාඛා කළමනාකරණ.

04 - 188

## මහජන බැංකුව - නිට්ටඹුව ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ යෝජනාව.

ණයකරුගේ නම : හේවා බහිතගේ කරුණාසේන මයා (අයිතිකරු - නිව් හේමාලි පොත්හල සහ ස්ටේෂනරීස්) හේවා බහිතගේ කසුන් හේමාල් මයා.
ප්‍රදානිත මුදල/ දිනය : 2017.04.11 - රු. මිලි. 2.25
අවම ලංසුව - රු. මිලි. 2.25

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2018.02.21 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ඩී. එස්. ලෝරන්ස් මිය විසින් සහතික කරන ලද 2017.04.07 දිනැති අංක 10890 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්,

හේවා බහිතගේ කසුන් හේමාල් මයා සහ හේවා බහිතගේ කරුණාසේන මයා යන අය විසින් පැහැර ඇති බැවින් එකී උකස්කරය යටතේ රුපියල් විසි දෙලක්ෂ පනස් දහසක (රු. 2,250,000.00) මුදලක් මහජන බැංකුවට දැනට අයවීමට ඇති බැවින්ද, 2017.10.31 දින සිට වාර්ෂිකව 18.5% බැගින් රුපියල් විසි දෙලක්ෂ පනස් දහසක (රු. 2,250,000.00) මුදල අයකර ගැනීම සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය හා අදාළ මහජන බැංකු පනතේ 29 එල් වගන්තිය යටතේ අයකරනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් විසි දෙලක්ෂ පනස් දහසක (රු. 2,250,000.00) මුදල අයකර ගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂෝක්මන් සහ සමරවික්‍රම විසින් එකී අංක 10890 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපළ සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### උකස් කර ඇති දේපළ පිළිබඳ විස්තර

(1) බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළයේ, උඩුගහ පත්තුවේ, අත්තනගල්ල ප්‍රාදේශීය සභා සීමාවේ, අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 349, මඩුවෙගෙදර ග්‍රාම නිලධාරි වසමේ, වැබොඩගල්ල ග්‍රාමයේ පිහිටි දංගොල්ල වත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. එන්. ඒ. ඩබ්. සූරියආරච්චි විසින් 2010.11.17 වැනි දින මැන සාදන ලද අංක 4689 දරන පිඹුරේ ලොට් අංක 123 ඒ ට මායිම්, උතුරට : අංක 2250 පිඹුරේ සඳහන් ලොට් අංක J සහ 115 ද, නැගෙනහිරට : අංක 2250 පිඹුරේ සඳහන් ලොට් අංක 115 සහ 124 ද, දකුණට : අංක 2250 පිඹුරේ සඳහන් ලොට් අංක 124 සහ 128 ද, බටහිරට : අංක 2250 පිඹුරේ සඳහන් ලොට් අංක J සහ 128 ද යන මායිම් තුළ පිහිටි පර්චස්

දාහතරක් (අ. 0, රූ. 0, පර්. 14) විශාල ඉඩම සහ එහි පිහිටි වැවිලි, ගොඩනැගිලි ආදී සියලු දේත් වේ.

මෙම ඉඩම අත්තනගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක B 192/111 හි ලියාපදිංචි කර ඇත.

(2) ඉහත කී වැබොඩගල්ල ග්‍රාමයේ පිහිටි දංගොල්ල වත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. එන්. ඒ. ඩබ්. සූරියආරච්චි විසින් 2010.11.17 දින මැන සාදන ලද අංක 4688 දරන පිඹුරේ ලොට් අංක 124ඒ ට මායිම්, උතුරට : ලොට් අංක 128, 123 සහ 112 ද, නැගෙනහිරට : ලොට් අංක 112 සහ 125 ද, දකුණට : ලොට් අංක 12, ලොට් J සහ 123 (වඩාත් නිවැරදි ලෙස ලොට් 125 සහ J) ද, බටහිරට : ලොට් J , ලොට් 123 සහ 128 ද (වඩාත් නිවැරදි ලෙස ලොට් J සහ 128) ද යන මායිම් තුළ පිහිටි පර්චස් දාහතක් (අ. 0, රූ. 0, පර්. 17) විශාල ඉඩම සහ එහි පිහිටි වැවිලි, ගොඩනැගිලි සියලු දේත් වේ.

මෙම ඉඩම අත්තනගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක B 192/112 හි ලියාපදිංචි කර ඇත.

ඉහත කී පිඹුරේ පාරවල් සඳහා වෙන්කළ කොටස්වල මාර්ග අයිතියද සමග වේ.

මෙම ණය මුදලට අමතරව ප්‍රසිද්ධ නොතාරිස් එස්. පී. එල්. විජේසිරිවර්ධන සහතික කළ අංක 17344 උකස් ඔප්පුව මගින් ඉහත සඳහන් දේපළෙහි උකස මත 2011.01.10 දින ලබාගෙන ඇති රු. මිලි. 3.75ක ණය මුදල ක්‍රමික තත්ත්වයෙන්ම පවත්වාගෙන යයි.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර.
ගම්පහ.

මහජන බැංකුව.
ප්‍රාදේශීය කාර්යාලය,
131, නුවර පාර,
බැලුම්මහර,
මුදුන්ගොඩ.

04 - 187

---

## කාර්ගිල්ස් බැන්ක් ලිමිටඩ් - මාතර ශාඛාව

1990 අංක 4 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීමයි.

ණනුදෙණුකරුගේ නම : ගුණරත්න ගෲප් ඔෆ් කම්පැනීස් (ප්‍රයිවට්) ලිමිටඩ්.

කාර්ගිල්ස් බැන්ක් ලිමිටඩ් හි අධ්‍යක්ෂක මණ්ඩලය විසින් 2019.02.22 වැනි දින පවත්වන ලද රැස්වීමකදී විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගන්නා ලදී.

එනම් ගුණරත්න ගෲප් ඔෆ් කම්පැනීස් (ප්‍රයිවට්) ලිමිටඩ් බන්ධනදායි වශයෙන් සහ දිමින්ගු විතානගේ පර්ස් ගුණරත්න උකස්කරු වශයෙන්, ලියාපදිංචි අංක PB 4847 දරන කාර්ගිල්ස් බැන්ක් ලිමිටඩ් නමට ප්‍රසිද්ධ නොතාරිස් රජීන්ද්‍ර නාරංගොඩ විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2016.08.23 දිනැති අංක 1640 දරන උකස් බැඳුම්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

එකී අංක 1640 දරන උකස් බැඳුම්කරය මත ගෙවිය යුතු සම්පූර්ණ මුදල ගෙවා නිම කරන තෙක් 2018.12.10 දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන්, රුපියල් හැත්තෑහත්ලක්ෂ තිස් හත් දහස් හත්සිය නමයයි ශත පහක (රු. 7,737,709.05) මුදලක් සහ එකී මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමකරනු ලබන තෙක් 2018.12.11 වැනි දින සිට රුපියල් හැත්තෑ තුන් ලක්ෂ තිස් තුන් දහස් තුන්සිය තිස් තුනයි ශත හතලිස් හතරක (රු. 7,333,333.44) මුදල මත වර්ෂයකට 19.53%ක පොළියක් ද, කාර්ගිල්ස් බැන්ක් ලිමිටඩ් (මෙහි මින් මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන) වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින්ද,

පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ. ඒ කෙසේද යත්,

එකී අංක 1640 දරන උකස්කරය යටතේ අයවිය යුතු එකී රුපියල් හැත්තෑහත්ලක්ෂ තිස් හත් දහස් හත්සිය නමයයි ශත පහක (රු. 7,737,709.05) මුදල ඉහතකී දිනයන්හි සිට විකිණීමේ දිනය දක්වා ඉහත සඳහන් පරිදි ලැබිය යුතු පොළියද ශාස්තුද වර්ෂ 1990 අංක 4 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය යටතේ අයකර ගත හැකි මුදල්ද (ඒ වන විට යම් මුදලක් ගෙවා ඇත්නම් එකී මුදල් අඩු කොට) අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයෙහි වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇත්තා වූ බැංකුව වෙත ගුණරත්න ගෲප් ඔෆ් කම්පැනීස් (ප්‍රයිවට්) ලිමිටඩ් බන්ධනදායි වශයෙන් සහ දිමින්ගු විතානගේ පර්සි ගුණරත්න උකස්කරු වශයෙන් උකස්කර ඇති දේපළ, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කොලොන්නාව, විහාර මාවතේ, අංක 182/3(50/3) දරන ස්ථානයහි පදිංචි බලයලත් වෙන්දේසිකරු තුසිත් කරුණාරත්න වෙත වර්ෂ 1990 අංක 4 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය පරිදි අධිකාරය සහ බලය පවරන ලෙසය.

### ඉහත සඳහන් උපලේඛනය

1. දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාළු කඩවත් සතර තුළ ගාල්ල මහ නගර සභා සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සීමාව තුළ අංක 102, දඩල්ල - බටහිර ග්‍රාම නිලධාරී වසම තුළ දඩල්ලෙහි පිහිටි වරිපනම් අංක 422, කොළඹ පාර දරන දේපළ සඳහා බලයලත් මිනින්දෝරු ආර්. එස්. වීරසේකර මහතා විසින් මැන සාදන ලද අංක 3736 සහ 2016.03.09 වැනි දින දරන පිඹුරේ කැබලි අංක 8A දරන කොටසට මායිම්, උතුරට : මෙම ඉඩමේ කැබලි අංක 7 සහ

කැබලි අංක A , නැගෙනහිරට ; මෙම ඉඩමේ කැබලි අංක A සහ 9, දකුණට ; මෙම ඉඩමේ කැබලි අංක 9 සහ ගාල්ල සිට කොළඹට දිවෙන මහ මාර්ගය, බටහිරට ; මෙම ඉඩමේ කැබලි අංක 7 සහ ගාල්ල සිට කොළඹට දිවෙන මහ මාර්ගය. යන මායිම් තුළ පිහිටි පර්චස් හයයි දශම පහයි දෙකක් (A:0, R:0, P:6.52 )ක් විශාල ඉඩම ඇතුළු ගොඩනැගිලි, ගහකොළ, පළතුරු ආදී සෑම සියලුදේ ම වේ. මෙම ඉඩම ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ Q 141/95 දරන පත් ඉරුවේ ලියාපදිංචි කර ඇත.

2. දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාළු කඩවත් සතර තුළ ගාල්ල මහ නගර සභා සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සීමාව තුළ අංක 102, දඩල්ල - බටහිර ග්‍රාම නිලධාරි වසම තුළ දඩල්ලෙහි පිහිටි වරිපනම් අංක 422, කොළඹ පාර දරන දේපළ සඳහා බලයලත් මිනින්දෝරු ආර්. එස්. වීරසේකර මහතා විසින් මැන සාදන ලද අංක 3736 සහ 09.03.2016 දින දරන පිඹුරේ කැබලි අංක 10A දරන කොටසට මායිම්, උතුරට ; මෙම ඉඩමේ කැබලි අංක 9 සහ කැබලි අංක A, නැගෙනහිරට ; මෙම ඉඩමේ කැබලි අංක A සහ දඩල්ල පොදු සුසාන භූමිය, දකුණට ; දඩල්ල පොදු සුසාන භූමිය හා ගාල්ල සිට කොළඹට දිවෙන මහ මාර්ගය, බටහිරට ; ගාල්ල සිට කොළඹට දිවෙන මහ මාර්ගය හා මෙම ඉඩමේ කැබලි අංක 9 යන මායිම් තුළ පිහිටි පර්චස් නවයයි දශම හතයි හයක් (A:0, R:0, P:9.76) විශාල ඉඩම ඇතුළු ගොඩනැගිලි, ගහකොළ, පළතුරු ආදී සෑම සියලුදේම වේ. මෙම ඉඩම ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ Q 139/31 දරන පත් ඉරුවේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය පරිදි,

චමිලා අබේසූරිය,
අංශ ප්‍රධාන - අයකර ගැනීම්.

04 - 14

---

## ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැනුම්දීම

2018.09.07 වැනි දින පවත්වන ලද රැස්වීමක දී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. ප්‍රසිද්ධ නොතාරිස් එස්. ඒ. ඩී. එස්. කේ. අතුකෝරාල විසින් සහතික කරන ලද 2015.05.25 දිනැති අංක 1792 දරන උකස් බැඳුම්කරයට අනුව 2018.07.31 වැනි දින තෙක් මුල් මුදල හා පොළිය වශයෙන් රුපියල් එක්කෝටි හැටහත් ලක්ෂ හත්දහස් එකසිය හැට හතයි ශත අනූහතක (රු. 16,707,167.97) මුදල සමග රුපියල් එක්කෝටි පනස් පන් ලක්ෂ හැත්තෑ පන් දහසක (රු. 15,575,000) මුදල මත වසරකට සියයට නවය (9%) බැගින් 2018.08.01 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් තවදුරටත් පොළිය ද ගොඩකවෙල, කෙලින් වීදිය, 'නිව්සිරි', අංක 99 A හි කොඩිතුවක්කු ආරච්චිලාගේ අරුණ ශාන්ත මහතා වෙතින් අයවිය යුතුව ඇත.

2. ප්‍රසිද්ධ නොතාරිස් එස්. ඒ. ඩී. එස්. කේ. අතුකෝරාල විසින් සහතික කරන ලද 2015.05.25 දිනැති අංක 1792 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු රුපියල් එක්කෝටි හැටහත් ලක්ෂ හත්දහස් එකසිය හැට හතයි ශත අනූහතක (රු. 16,707,167.97) මුදල සමග 2018.08.01 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොළියද, ලංකා බැංකු ආඥාපනතේ 26 වෙනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල්ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට මහනුවර, ටොරින්ටන් පාරේ, අංක 24හි වෙන්දේසිකාර ෂොක්මන් හා සමරවික්‍රම හට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වැනි වගන්තිය යටතේද, ලංකා බැංකු ආඥාපනතේ 21 වන වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළ කිරීමට ලංකා බැංකුවේ, ගොඩකවෙල ශාඛාවේ ප්‍රධාන කළමනාකරු හට මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

#### උපලේඛනය

1. සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කියේ, අටකලන් කෝරළේ, මැදපත්තුවේ, ගොඩකවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ ප්‍රාදේශීය සභා සීමාවේ, ගොඩකවෙල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, ගොඩකවෙල පිහිටි "පල්ලෙදෙනිය හෙවත් පල්ලෙදෙනිය කොරටුව" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. ඒ. කේ. එල්. එදිරිසිංහ විසින් සාදන ලද 2007.09.21 දිනැති අංක 1451 දරන පිඹුරෙහි ලොට් 01 ලෙස දක්වා සීමා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල දකුණට ; ප්‍රධාන පාර ද, නැගෙනහිරට ; වරිපනම් අංක 99 ද, දකුණට ; පන්සල්වත්ත ද, බස්නාහිරට ; වරිපනම් අංක 101 දරන ඉඩම ද මායිම්ව පර්චස් පහයි දශම තුනයි හතක (අ. 0, රූ. 0, පර්. 5.37) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය ඇඹිලිපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A 07/108හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය පරිදි,

ටී. ඒ. වී. රංජනී,
සහකාර කළමනාකාරිණී.

2019 ක් වූ ජනවාරි මස 29 වැනි දින,
ලංකා බැංකුව,
ගොඩකවෙල,

04 - 377

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
## සංශෝධිත ගාස්තු

2014 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

***සියලුම ගැසට් පත්‍ර නියමිත දිනට www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.***

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | | | | රු. ශ. |
|---|---|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... | ... | ... | ... | 137 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට | ... | ... | ... | 137 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට | ... | ... | ... | 1,300 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට | ... | ... | ... | 2,600 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙළවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* රු. ශ. | *තැපැල් ගාස්තුව* රු. ශ. |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 0 | 9,340 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 0 | 950 0 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු සහ පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 0 | 750 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 0 | 2,500 0 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 0 | 450 0 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 0 | 275 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 0 | 4,360 0 |
| V වැනි කොටස (මගීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 0 | 3,640 0 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 0 | 1,250 0 |
| අති විශෙෂ ගැසට් පත්‍රය... ... ... ... ... ... ... ... | 5,145 0 | 5,520 0 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිල *රු. ශ.* | තැපැල් ගාස්තුව *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 0 | 60 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 0 | 60 0 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 0 | 60 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 0 | 120 0 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 0 | 60 0 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 0 | 60 0 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 0 | 60 0 |

*** කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනිපිටපත් මිල දී ගත හැක.**

# ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන්ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2019** | | | |
| **අප්‍රේල්** | 2019.04.05 | සිකුරාදා | 2019.03.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.04.12 | සිකුරාදා | 2019.03.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.04.18 | බ්‍රහස්පතින්දා | 2019.04.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.04.26 | සිකුරාදා | 2019.04.12 | සිකුරාදා | දහවල් | 12.00 |
| **මැයි** | 2019.05.03 | සිකුරාදා | 2019.04.18 | බ්‍රහස්පතිදා | දහවල් | 12.00 |
| | 2019.05.10 | සිකුරාදා | 2019.04.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.05.17 | සිකුරාදා | 2019.05.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.05.24 | සිකුරාදා | 2019.05.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.05.31 | සිකුරාදා | 2019.05.17 | සිකුරාදා | දහවල් | 12.00 |
| **ජුනි** | 2019.06.07 | සිකුරාදා | 2019.05.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.06.14 | සිකුරාදා | 2019.05.31 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.06.21 | සිකුරාදා | 2019.06.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.06.28 | සිකුරාදා | 2019.06.14 | සිකුරාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2019 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ - 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.